**කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධිත ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය**

-----------------------------------------------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මතය

---------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 99 වගන්තිය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිගේ අංක UGC /FA/GH/2002 හා 2003 ජනවාරි 13 දිනැති ලිපියට පටහැනිව කටයුතු කරමින්, ආයතනයේ ආදායමට බැර කළයුතුව තිබූ 2008 වර්ෂය දක්වා වූ පාඨමාලා ගාස්තු ආදායමින් කොටසක් යොදා ගොඩනගා තිබූ “ සංවර්ධන අරමුදලෙන් ” රු.673,198 ක් උපයෝගි කරගෙන සමාලෝචිත වර්ෂයේදී ස්ථාවර වත්කම් මිලදී ගෙන තිබූ අතර එම වටිනාකම පොදු සංචිතයට ගලපනු වෙනුවට “ රජයේ ප්‍රාග්ධන ප්‍රදාන ” ගිණුමට බැර කර තිබුණි.

(ආ) පුස්තකාල හා තොරතුරු කළමනාකරණය පිළිබඳ අන්තර් මාධ්‍ය සහතික පාඨමාලාව 09 (Intermediate Certificate in Library & Information Management 09) වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු ආදායම් රු.16,710 ක් ඉදිරියට ලැබූ පාඨමාලා ආදායමට හිලව් කර දක්වා තිබුණි.

1.2.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

2003 ජූනි 02 දින හා අංක පී.ඒ.ඩී. 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙ 4.2.6 ඡේදය ප්‍රකාරව කාර්තුමය කාර්යය සාධන වාර්තා සකස් කර නොතිබුණි.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

-------------------------------------

2.1 මූල්‍ය සමාලෝචනය

----------------------

2.1.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය, පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.8,430,218 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.7,670,113 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබුණු රු.5,855,000 ක් වූ රජයේ ප්‍රදානය හේතුකොටගෙන ඌනතාවය රු.2,575,218 ක් දක්වා අඩුවී තිබු අතර, ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබී තිබුණු රු.5,497,000 ක් වු රජයේ ප්‍රදානය හේතු කොටගෙන එම ඌනතාවය රු.2,173,113 ක් දක්වා අඩුවී තිබුණි.

2.2 මෙහෙයුම් සමාලෝචනය

---------------------------

2.2.1 කාර්ය සාධනය

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) ලෝක බැංකුවේ දෙවන සාමාන්‍ය අධ්‍යාපන ව්‍යාපෘති ආධාර යටතේ ස්ථාපිත කර ඇති ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ මූලික අරමුණ වාර්ෂිකව සිසුන් 300 - 400 ත් අතර ප්‍රමාණයක් පුහුණු කිරීම වු නමුත් පාඨමාලා ආරම්භ කරන ලද 2003 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වාම ලියාපදිංචි වු ශිෂ්‍ය සංඛ්‍යාව ඊට වඩා අඩු වු අතර එයින් ද සැලකිය යුතු කොටසක් පාඨමාලා සාර්ථකව අවසන් කර නොතිබුණි.

| වර්ෂය | පාඨමාලා සංඛ්‍යාව | ලියාපදිංචි වු සිසුන් සංඛ්‍යාව | පාඨමාලාව සාර්ථකව අවසන් කළ සිසුන් | |
|---|---|---|---|---|
| | | | සංඛ්‍යාව | ප්‍රතිශතය % |
| 2004.12.31 දක්වා | 09 | 344 | 201 | 58% |
| 2005 | 08 | 191 | 80 | 42% |
| 2006 | 06 | 133 | 70 | 53% |
| 2007 | 10 | 215 | 96 | 45% |
| 2008 | 06 | 178 | 114 | 64% |
| 2009 | 03 | 111 | 63 | 57% |
| | 02 | 16 | පාඨමාලා අවසන් කර නැත | - |
| 2010 | 07 | 102 | - එම - | - |

(ආ) වාර්ෂික ක්‍රියාකාර් සැලැස්මෙහි ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත පහත සඳහන් කාර්යයන් 06 ක් ක්‍රියාත්මක කොට නොතිබුණි.

(i) වාර්ෂික සම්මන්ත්‍රණය (NILIS Symposium)
(ii) කුඩා පර්මාණ පර්යේෂණ ව්‍යාපෘති 03 ක් ක්‍රියාත්මක කිරීම
(iii) ප්‍රචාරණය සඳහා විස්තර පත්‍රිකා බෙදා හැරීම
(iv) විද්‍යුත් සඟරා (E-Journal) පිළියෙල කිරීම
(v) දුරස්ථ අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
(vi) ශ්‍රී ලංකා පුස්තකාල සංගමය සමඟ පැවැත්වෙන සහයෝගීතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

(ඇ) ආයතනය විසින් පවත්වාගෙන යනු ලැබූ පාඨමාලා 06 ක් නියමිත කාලය තුළ අවසන් කර නොතිබුණි. ප්‍රමාද කාලය මාස 02 සිට වසර 01 ත් මාස 05 ත් අතර විය.

## 2.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

### 2.3.1 සුනාමි වැඩසටහන

පුස්තකාල ක්ෂේත්‍රයේ සංවර්ධන කාර්යයන් වෙනුවෙන් කැනේඩියානු පුස්තකාල සංගමය මගින් 2007 ඔක්තෝබර් 05 දින ලබා දී තිබු රු.533,000 ක් වු ආධාර මුදලෙන් අදාල කාර්යයන් ඉටු නොකර සමාලෝචිත වර්ෂය අවසානය වන විට වසර 03 කටත් ආසන්න කාලයක් බැංකු ජංගම ගිණුමක නිෂ්ක්‍රීයව තබා තිබුණි.

2.3.2 තොග හා ස්ථාවර වත්කම් පාලනය

--------------------------------------

(අ) භාණ්ඩ ලැබීම් හා නිකුත් කිරීම් පත් භාවිතා කිරීමත් , තොග පොත අධීක්ෂණය කිරීමත්, වර්ෂය අවසානයට තොග පොත තුලනය කිරීමත් සිදු කර නොතිබූ අතර භෞතික තොග ශේෂයම තොග ලේඛනයේ ශේෂය ලෙස සමීක්ෂණ වාර්තාවේ දක්වා තිබුණි.

(ආ) භාණ්ඩ සමීක්ෂණ සිදුකල යුතු දිනවකවානු සමීක්ෂණ මණ්ඩල පත්කිරීමේ ලිපියෙහි සඳහන්ව නොතිබුණි.

(ඇ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 හා 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI / 2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛ ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් සහ පරිගණක, උපාංග හා මෘදුකාංග සම්බන්ධ ලේඛනයක් පවත්වා නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට පරිගණක, උපාංග හා මෘදුකාංග පිරිවැය රු.7,383,559 ක් ද පුස්තකාල පොත් හැර අනෙකුත් ස්ථාවර වත්කම් පිරිවැය රු.13,551,498 ක් ද විය.

(ඈ) මු.රෙ. 756 ප්‍රකාරව පොත් හා වාර සඟරා සම්බන්ධයෙන් භාණ්ඩ සමීක්ෂණයක් ආයතනය ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම සිදු කර නොතිබූ අතර 2010 දෙසැම්බර් 31 දිනට පොත් තොගයේ පිරිවැය රු.6,878,681 ක් වී තිබුණි.

(ඉ) 2010 ජුනි 30 දිනැති අබලි භාණ්ඩ වෙන්දේසියේදී අලෙවි කරන ලද පරිගණක මොනිටර් 07 කට අදාළ වටිනාකම් ගණනය කර ඒවා ගිණුම්වලින් ඉවත් කිරීමටත් ඉන්වෙන්ට්‍රි ලේඛනයේ සටහන් කිරීමටත් කටයුතු කර නොතිබුණි.

(ඊ) අළුත්වැඩියා කළ යුතු, විකිණිය යුතු හා විනාශ කළ යුතු බවට නිර්දේශිත භාණ්ඩ ඒකක 18 ක් සම්බන්ධයෙන් අදාල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.3.3 මුල්‍ය පාලනය

---------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) මුදල් රෙගුලාසි 395 (ඌ) ඡේදයෙන් බැහැරව දෛනික ලැබීම් බැංකු ගත කිරීම , මුදල් පොත පවත්වා ගෙන යාම හා බැංකු සැසදුම් පිළියෙල කිරීම, යන සියලු කාරණයන් එකම නිලධාරියෙකු විසින් සිදුකර තිබුණි.

(ආ) මුදල් ලැබීම් නියමිත දිනට මුදල් පොතේ සටහන් කර නොතිබුණි.

(ඇ) මුදල් පොතේ ප්‍රමාණවත් මුදල් ශේෂයක් නොතිබියදී චෙක්පත් ලියා තිබුණි.

(ඈ) ලැබී තිබූ මුදල් ඇණවුම් අප්‍රමාදව නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.4 ප්‍රමාණවත් අධිකාර් බලයකින් තහවුරු නොවූ ගනුදෙනු
-----------------------------------------------------------
පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 89 වගන්තිය, 1959 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතේ 47 වගන්තිය සහ 1988 අංක 47 දරන සේවක භාරකාර අරමුදල් පනතේ 16(2) වගන්තියට පටහැනිව විශ්ව විද්‍යාල අර්ථ සාධක අරමුදල, විශ්‍රාම වැටුප් සහ සේවක භාරකාර අරමුදලට දායක මුදල් ගණනය කිරීමේදී "අධ්‍යයන දීමනාව" සැලකිල්ලට ගැනීම හේතුවෙන් අදාළ අරමුදල් සඳහා රු.96,309 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) 2002 ඔක්තෝබර් 25 දිනැති අංක බීඩී/පීඑෆ්/1/174/1 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ උපදෙස්වලින් බැහැරව භාෂා ප්‍රවීණතා දීමනා ලෙස රු. 20,190 ක් ගෙවා තිබුණි.

2.5 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාර් සැලැස්ම
---------------------------------------------
ආයතනයේ සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාර් සැලැස්ම, 2003 ජූනි 02 දින හා අංක PED/12 දරන චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව සකස් කර නොතිබූ අතර එය පාලන උපකරණයක් ලෙසද යොදාගෙන නොතිබුණි.

2.6 අයවැය පාලනය
-------------------
පාඨමාලා 03 ක අයවැයගත වියදම හා සත්‍ය වියදම අතර 65% සිට 82% අතර විචලතාවයන් නිරීක්ෂණය වීම හේතුවෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබුණි.

3. පද්ධති හා පාලන
--------------------
විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට වරින් වර යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) මූල්‍ය පාලනය
(ආ) ගිණුම්කරණය
(ඇ) තොග
(ඈ) ස්ථාවර වත්කම්
(ඉ) කාර්ය සාධනය
(ඊ) සැලසුම්කරණය